# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## 2016 මැයි - හදිසි ආපදා මෙහෙයුම් උපදෙස් පත්‍රිකාව

සභාපතිතුමිය වෙතින් -

හදිසි ආපදා මෙහෙයුම් වල නිරත ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සියලු දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ළමාරක්ෂක නිලධාරීන් වෙත -

සැලකිය යුතුයි -

අදාල දිස්ත්‍රික් නිලධාරීන් විසින් මෙම උපදෙස් පත්‍රිකාව සියලු නිලධාරීන් රැස් කර කණ්ඩායම් සාකච්චාවක් පවත්වා මෙහි අන්තර්ගතය සවිස්තරව පැහැදිලි කිරීමෙන් අනතුරුව සියලුම සහභාගී වන්නන්ගේ අත්සන් සහිතව පෙරලා සභාපතිතුමිය වෙත සතියක් ඇතුලත එවිය යුතුය. මෙම උපදෙස් පත්‍රිකාවේ පිටපතක් සෑම නිලධාරියෙකුටම ලැබීමට සැලැස්විය යුතුයි.

**මූලික වගකීම්**

1. අවතැන් වූ පවුල් සදහා මූලික අවශ්‍යතා සපුරා දී ඔවුන් සුරක්ෂිත කිරීමට රජය ගන්නා ක්‍රියා මාර්ග වලට දායක වීම
2. කොට්ටාශ මට්ටමින් පවත්වන දෛනික ආපදා කළමනාකරණ කේන්ද්‍රයේ රැස්වීමට සහභාගි වී ළමුන් ගේ විශේෂ අවශ්‍යතා මතු කිරීම

   උදා:

   - අත දරුවන්
   - පෙර පාසල් වියේ දරුවන්
   - ප්‍රාථමික ශ්‍රේණි වල දරුවන්
   - යොවුන් වියේ දරුවන් (12-15) සහ (15-18)
   - විශේෂ අවශ්‍යතා ඇති ළමුන්
   - අධ්‍යාපනය ලබන දරුවන්

3. තනි වූ, වෙන් වූ සහ මව හෝ පියා අහිමි වූ දරුවන් හඳුනා ගැනීම සහ පසු විපරම් කිරීම
4. කඳවුරු තුල සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය තාක්ෂණික දායකත්වය ලබා දීම
5. ළමුන් සහ කාන්තාවන්ගේ මෙන්ම පිරිමින්ගේ අවශ්‍යතා පිළිබඳවත් සංවේදී වීම
6. මනෝ සමාජීය මැදිහත්වීම් සම්බන්ධීකරනය
7. නිශ්චිත අවතැන් වූ ප්‍රජා සම්බන්ධ පැවරුම් ලැබීමෙන් අනතුරුව එකී ප්‍රජාවන් සමග සුහදව සම්බන්ධ වී සියලු ළමුන් කෙරේ විශේෂ අවධානයක් යොමු කිරීම.
8. කණ්ඩායම් හැගීමෙන් සේවය කිරීම සහ අදාල සේවා සපයන්නන්, ස්වේච්චා සංවිධාන සහ ක්‍රියාකරුවන් සමග සාර්ථක ජාලීයකරණයක් පැවැත්වීම

9. විශේෂ සිදුවීම් සහ නිරීක්ෂණ වහාම අධිකාරියේ උසස් නිලධාරීන් හට වාර්තා කිරීම සහ අවශ්‍ය සෑම අවස්ථාවකදීම ඔවුන් ගෙන් තාක්ෂණික උපදෙස් ලබා ගැනීම

**විශේෂ උපදෙස්**

**A. <u>කඳවුරු තුල සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමට අවශ්‍ය තාක්ෂණික දායකත්වය ලබා දීම</u>**

I. කඳවුරු විධිමත් කිරීම සඳහා ආදර්ශ චර්යා මාලාවක් (code of conduct) සහ ලියාපදිංචි කිරීම සඳහා සුදුසු ආකෘති සැපයීම
II. කඳවුරු සඳහා දින චර්යාවක් පිහිටුවීම
III. ජලය සහ වෙනත් ද්‍රව්‍ය බෙදා හැරීම පිලිබඳ කාන්තා පක්ෂ නියෝජනය
IV. සනීපාරක්ෂාව පිලිබඳ ඇගයීම සහ කාන්තාවන්ගේ විශේෂ අවශ්‍යතා
V. කඳවුරට පැමිණෙන පිටස්තර පුද්ගලයින් සහ සංවිධාන නියාමනය - පොලිස් රාජකාරී සහ කඳවුරු කළමනාකරණය මේ සම්බන්ධව ඒකාබද්ධ කිරීම
VI. කාන්තා පොලිස් නිලධාරීන් අනුයුක්ත කිරීම

**B. <u>මනෝ සමාජීය මැදිහත්වීම් සම්බන්ධීකරනය</u>**

I. මේ සම්බන්ධව අධිකාරිය විසින් විශේෂඥ උපදේශක මණ්ඩලයක් නම් කර අදාල ක්‍රමවේද, යාන්ත්‍රණ සහ පිළිවෙත් සඳහා නිර්දේශ කඩිනමින් ලබා ගැනීමට අපේක්ෂා කරයි.

II. දිස්ත්‍රික් මනෝ සමාජීය සම්බන්ධීකරණ නිලධාරීන් විසින් අවශ්‍ය කටයුතු සම්පාදනය කර ප්‍රධාන කාර්යාලයට දැනුම් දිය යුතු වේ

## C. <u>තනි වූ සහ වෙන් වූ දරුවන් (Unaccompanied and separated children) සහ මව හෝ පියා අහිමි දරුවන් (single parent children)</u>

පහත සඳහන් කරුණු මැනවින් අධ්‍යයනය කර අවශ්‍ය ලෙස සෙසු නිලධාරීන් සහ කඳවුරු භාර පුද්ගලයින් සහ නිලධාරීන් දැනුවත් කල යුතු ය.

I. කඳවුරු තුල ලියාපදිංචි කිරීමේ ලේඛන මැනවින් පරීක්ෂා කර වැඩිහිටියන් සහ දරුවන් ගේ අනන්‍යතාවය තහවුරු කරගත යුතු වේ.
II. යම් කිසි දරුවෙකුගේ භාරකාරත්වය වෙනස් වී තිබේ නම් එයට හේතුව විපරම් කර බලන්න.

**නිර්වචන**

යම් දරුවෙක් ගේ තත්වය වර්තමාන මොහොතේ ඉදිරිපත් වන කරුණු ආශ්‍රිතව තීරණය කල යුතු වේ. ඒ අනුව

**<u>තනි වූ දරුවෙක්</u>** වන්නේ සිය පවුලේ වැඩිහිටියන්ගෙන් වෙන් වී නාඳුනන පුද්ගලයින් සමග සිටින දරුවෙකි.

**<u>වෙන් වූ දරුවෙක්</u>** වන්නේ සිය පවුලේ වැඩිහිටියන්ගෙන් වෙන් වී නමුත් ඥාතීන් සමග සිටින දරුවෙකි.

මෙම දරුවන් දෙවර්ගයම භාරකාරත්වය වෙනස් වූ දරුවන් නිසා **<u>නෛතික ආරක්ෂාව</u>** අවශ්‍ය දරුවන් සේ සැලකේ. එබැවින් විකල්ප රැකවරණ ක්‍රියා මාර්ග සලකා බැලීම සඳහා පරිවාස නිලධාරී හට යොමු කිරීමක් අවශ්‍ය වේ.

**<u>මව හෝ පියා අහිමි වූ දරුවෙක්</u>** - නමුත් එක් දෙමාපියෙක් සමග සිටිනවානම් එවන් පවුල් ඒකක සඳහා නෛතික මැදිහත් වීමක් අවශ්‍ය නොවුනත් දැඩි **<u>සමාජ ආරක්ෂණ</u>** පිළිවෙතක් අනුගමනය කල යුතු වේ. ඒ අනුව අවශ්‍යතා ඇගයීමක් සහ සත්කාරක සැලැස්මක් එවන් ළමුන් සම්බන්ධයෙන් සකස් කිරීමට රජය බැඳී සිටියි.

ඇමුණුම 1 බලන්න.

මෙම දරුවන් තෙවර්ගයම ළමා ආරක්ෂණ කටයුතු වල නිරත සියලු නිලධාරීන් ගේ අවධානයට පත්‍ර විය යුතුය. ඔවුන්ගේ රැකවරණ තත්වය සහ පවුල් තත්වය පිලිබඳ වෙනස් වීම් සිදු විය හැකි නිසා මේ තෙවර්ගයට වැටෙන එක් එක් ළමයා පිලිබඳ ව විස්තර ප්‍රගති වාර්තා වලට ඇතුලත් විය යුතුය.

## D. <u>අධ්‍යාපනික ආධාර අවශ්‍ය දරුවන් ගේ අවශ්‍යතා ඇගයීම</u>

පහත සදහන් ආකෘතිය මේ සදහා යොදා ගන්න

| ළමුන් පිලිබඳ විස්තර සංඛ්‍යාව - වයස් ඛණ්ඩය - පාසල සහ පදිංචි ස්ථානය | හඳුනාගත් අධ්‍යාපනික අවශ්‍යතා (අංක වශයෙන් සදහන් කරන්න ) | අවශ්‍යතා ඉටු කිරීමේ ක්‍රමවේද (අංක අනු පිළිවෙලට) - සේවා සපයන ආයතන සහ සංවිධාන |
|---|---|---|
| | | |
| | | |
| | | |